DOI : 10.31357/fhssmph.2015.00734

# ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාදය හා එහි ආසන්නතම සමාජ ප්‍රතිවිපාක (ගම්පහ අධිකරණ කලාපය ඇසුරින්)

මහසිංහ ආරච්චිලාගේ ලතා රංජනී

22 JUN 2015

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා අපරාධ විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

# කර්තෘ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය බී.ජ්. ටෙනිසන් පෙරේරා, මහාචාර්ය යසාංජලී දේවිකා ජයතිලක, ජ්‍යෙෂ්ඨ කථිකාචර්ය ඩබ්ලිව්.එම්. ධනපාල යන අයගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

කර්තෘ :- ....................................   දිනය :- 2015/06/22

2015.06.16 දින පැවති වාචික පරීක්ෂණයෙන් පෙන්වා දුන් සංශෝධන නිවැරදි කර ඇති බව සහතික කරමු.

## උපදේශකවරු

1. මහාචාර්ය බි.ජ්. ටෙනිසන් පෙරේරා මහතා

   අත්සන :- ..............................

   දිනය :- 22nd June 2015

2. මහාචාර්ය යසාංජලි දේවිකා ජයතිලක මිය

   අත්සන :- ..............................

   දිනය :- 2015/06/22

3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතා

   අත්සන :- ..............................

   දිනය :- 2015/6/22

## ස්තුතිය

මෙම පර්යේෂණය ආරම්භයේ සිට අවසානය දක්වා මා දිරිමත් කළ සමාජ හා මානව විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය ජයසුන්දර ගුරු පියා සිහිපත් කරන්නේ කෘතඥ පූර්වකය. වඩාත් විමසිලිමත් ව මාගේ නැණ නුවණ පෝෂණය කරන්නට පහන් ටැඹක් වූ මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා ගුරු පියාව ද මහාචාර්ය යසාංජලි දේවිකා ජයතිලක ගුරු මාතාව ද ආචාර්ය ධනපාල විජේසිංහ ගුරු පියාව ද මෙහිදී ඉතා බැතියෙන් සිහි කරමි. එම ගුරු භවතුන් මාගේ උපදේශකවරු නොවන්නට මා මෙම පර්යේෂණය නොකරන්නට ඉඩ තිබුණි. පර්යේෂණයේ දී ඔවුන් ලබා දුන් සහයෝගය වචන කිහිපයකින් ප්‍රකාශ කිරීම දුෂ්කරය. එමෙන්ම අධ්‍යයන අංශයේ සෙසු ආචාර්ය මණ්ඩලය ද කාර්ය මණ්ඩලය ද පශ්චාද් උපාධි පීඨයේ පීඨාධිපතිණිය මෙන්ම කාර්ය මණ්ඩලයද මෙහිදී සිහිපත් කරමි. විවිධ පොත පත ලබා දෙමින් මාව උනන්දු කළ කැළණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය අනුෂා එදිරිසිංහ මා මිතුරියටද අවංක ආදර ස්තුතිය ප්‍රකාශ කරමි.

රැකියාව කරන කාලය තුළ මෙවන් පර්යේෂණයක් කිරීමට අවශ්‍ය පසුබිම මෙන්ම විශ්වවිද්‍යාල ශාස්තු ලබාදෙමින් මාව දිරිමත් කළ හිටපු ප්‍රජා විශෝධන කොමසාරිස්වරුන්ට මෙන්ම වත්මන් කොමසාරිස් සන්නසූරිය මැතිණියව ද ඉතා භක්තියෙන් සිහිපත් කරමි.

එමෙන්ම පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබාගැනීමට නොමසුරුව උදව් උපකාර කළ ගම්පහ මහාධිකරණ විනිසුරුතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් පූගොඩ, ගම්පහ ,අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණවල විනිසුරුතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කෘතඥ පූර්වකව ස්තුති කරමි.

තවද පර්යේෂණ මාතෘකාව තෝරාගැනීමේ සිට අවසානය දක්වා විවිධ පොත පත හා අවශ්‍ය සියළු දත්ත ලබා දුන් නීතිපති පාලිත ප්‍රනාන්දු මැතිතුමා ඇතුළු නීතිපති දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලයටත් කෘතඥ පූර්වකව ස්තුති කරමි.

එමෙන්ම අවශ්‍ය දත්ත ලබාගැනීමට මහෝපකාරී වූ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් කමලිනී ද සිල්වා මැතිණියට හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් අරන්දර මැතිතුමා ද මෙහිදී ඉතා භක්තියෙන් සිහිපත් කරමි. දත්ත ලබා ගැනීමට සහයෝගය දුන් රජයේ රස පරීක්ෂකතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ,ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර් මෙන්ම මා මිතු ලලිත් අබේසිංහ ඇතුළු කාර්ය මණ්ඩලයටත් ගම්පහ අධිකරණ කලාපයේ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ටත් , පොලිස් නිලධාරීන්ටත් ,නීතිඥ ප්‍රජාව මෙන්ම නඩුවල පාර්ශවකරුවන්ට ද අවංක ආදර ස්තුතිය ප්‍රකාශ කරමි.

එමෙන්ම විවිධ පොත පත සොයා ගැනීමට උදව් උපකාර කළ මාගේ මිතුරන් වූ ජාතික පුස්තකාල හා ලේඛනාරක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂක සුනිල් මහතා ද සෝදුපත් බැලීමෙන් සහයෝගය දුන් ගම්පහ කහටාන විද්‍යාලයේ සිංහල ආචාර්ය ආර්. එම්. කුසුම්සිරි මහතා ද බුත්තල දුටුගැමුණු විද්‍යාලයේ සිංහල ආචාර්ය පද්මාලිව ද මෙහිදි සිහිපත් කරමි.

ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීමට මෙන්ම පර්යේෂණය යතුරුලියනය කිරීමට උදව් උපකාර කළ මහේෂි, යමුනා, දිල්රුක්ෂි, ක්‍රිෂ්නා, ඉනෝකා, නිර්මාණී, නදීෂා, කුමුදු ,කල්පනී, කාන්ති, සංජීව, ප්‍රබෝධ මෙන්ම ජේලර් සුමුදු පෙරේරා යන සහෘදයන්ටද කෘතඥ පූර්වකව ස්තුති කරමි. තවද මාගේ අධ්‍යාපන ගමනට නිති ආශිර්වාද කරන, වැටෙන හැම විට එදා මෙන් අදත් මට දිරිදෙන කාමලින් සේරසිංහ ඇතුළු පවුලේ සැමත් සන්ද්‍යා පෙරේරා ඇතුළු පවුලේ සැමත් මෙහිදි කෘතඥව සිහි කරමි.

සැමදා මගේ ගමනට නිති ආශීර්වාද කරන මෙත්තානන්ද හිමියන් සහ සුගතානන්ද හිමියන්වත් භක්තියෙන් සිහිපත් කරමි.

එමන්ම නිවසේ සියළු කටයුතු උර මත දරා අධ්‍යයන කටයුතුවලට නිදහස ලබා දුන් දයාබර සැමියා වු චන්නටත්, ආදරණීය පුත් මොවිඳුටත් ආදරණීය අම්මාටත් ජීවතුන් අතර නැති මුත් කොහේ හෝ ඉඳ ජීවිතයට නිති ආශිර්වාද කරන තාත්තාටත්, සහෝදරිය හා සහෝදරයන්ටත්, ඔවුන්ගේ දුවා දරුවන් වන අයේෂා, කවීෂා, සුපුන් , කවිදු, සනුජ, ජනිත්, ඔකිත මෙන්ම සෝමසිරි මාමා ,නැන්දා හා දීපානි නංගිවත් මෙහිදී ඉතා භක්තියෙන් සිහිපත් කරමි.

පිදුම් පොත දයාවෙන් සදාදර නුඹලාට ...

දිවි ගෙවූ පුරාවට
ස්වශක්තිය පිහිට කොට
සුර ලොවේ සිටන් මට
අදත් මඟ කියා දෙන
යනෙන මඟ මා රකින
දයාබර තාත්තට ...

ඔවා මිණි පළඳවා
එකළු කළ මගේ ලොව
දුක හදින් සුව විඳින
දුකෙදිත් සැපෙදිත්
හෙවනැල්ල වී රැදෙන
දයාබර අම්මට ...

දිවි මගේ අතර මැද
මගේ හදට තුටින් වැද
ජීවිතයේ සවිය වූ
සෙනෙහසේ සුවඳ පොද
දයාබර මා හිමිට .....
මොවිඳු මගේ රන් පුතුට ...

සිදාදිය නුහුරු මට
දිරි දෙමින් ඉගෙනුමට
යෝධ සවියක් වෙමින්
පාර කී කඩවතට
මව්පියන් ලෙසින් වුන්
ජස්ටින් අයියා සහ අක්කට ...

පටුන

පිටු අංකය


පළමු පරිච්ඡේදය - හැඳින්වීම හා ක්‍රම විද්‍යාව

1.1 හැඳින්වීම ........................................ 1-3

1.2 අධ්‍යයන ගැටළුව ........................................ 4-5

1.3 අධ්‍යයනයේ අරමුණු.. ........................................ 5

1.4 නියැදිය ........................................ 5-6

1.6 මූලාශ්‍ර ........................................ 8-9

1.7 අධ්‍යයනයේ සීමා සහ ගැටළු ........................................ 9-12

1.8 පරිච්ඡේදකරණය ........................................ 13-14

දෙවැනි පරිච්ඡේදය - සාහිත්‍ය විමර්ශනය

2. සංකල්ප හැඳින්වීම ........................................ 15

2.1 අපරාධ යනු කුමක්ද ........................................ 15-26

2.2 අපරාධ යුක්තිය යනු කුමක්ද ........................................ 27-30

2.3 අපරාධ යුක්තිය ප්‍රමාදවීම සහ එහි සමාජ ප්‍රතිවිපාක ........................ 30-31

2.4 ඇමෙරිකාවේ යුක්තිය පසිඳලීම සහ ප්‍රමාදය ........................ 31-36

2.5 ඉන්දියාවේ යුක්තිය පසිඳලීම සහ ප්‍රමාදය ........................ 36-40

2.6 බ්‍රිතාන්‍යයේ යුක්තිය පසිඳලීම සහ ප්‍රමාදය ........................ 40-44

2.7 ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීම සහ ප්‍රමාදය........................ 45-61

තෙවැනි පරිච්ඡේදය - අධිකරණ ක්‍රමයේ විකාශනය

3. පුරාතන ලංකාවේ අධිකරණ ක්‍රමවේද........................ 62

3.1 පූර්ව යටත් විජිත යුගයේ යුක්තිය පසිඳලීම........................ 62-79

3.2 උඩරට රාජධානි සමයේ යුක්තිය පසිඳලීම........................ 79-91

3.3 පෘතුග්‍රීසි යුගයේ යුක්තිය පසිඳලීම ........................ 92

3.4 ලන්දේසි යුගයේ යුක්තිය පසිඳලීම ........................ 93-101

3.5 යුගයේ යුක්තිය පසිඳලීම ........................................ 105-106

3.6 ප්‍රථම ජනරජ යුගයේ යුක්තිය පසිඳලීම ........................................ 106-111

## හතරවැනි පරිච්ඡේදය - යුක්තිය පසිඳලන ආයතන

4. යුක්තිය පසිඳලීමේ ආයතන හඳුනාගැනීම සහ එහි කාර්ය පටිපාටිය................ 112

4.1 අධිකරණය........................................ 113-127

4.2 පොලිසිය........................................ 127-130

4.2.1 ශ්‍රී ලංකාවේ පොලිස් සේවයේ ආරම්භය සහ විකාශනය................. 130-137

4.2.2 යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ පොලිසීයේ කාර්යභාරය............................ 137-141

4.3 නීතිපති දෙපාර්තමේන්තුව........................................ 142-149

4.4 රස පරීක්ෂක දෙපාර්තමේන්තුව........................................ 150-152

4.4 ඇඟිලි සලකුණු දෙපාර්තමේන්තුව........................................153-157

4.5.1. ඇඟිලි සලකුණුවල ආරම්භය සහ ව්‍යාප්තිය........................................ 158-164

4.6 අධිකරණ වෛද්‍ය නිලධාරියා........................................ 164-166

4.7 නීතිඥයින්ගේ කාර්යභාරය........................................ 166-168

## පස්වැනි පරිච්ඡේදය - යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයේ ස්වභාවය

5.1 අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම........................................ 169-172

5.2 අධ්‍යයනය කළ අපරාධ නඩුවල ස්වාභාවය........................................ 172-180

5.3 යුක්තිය පසිඳලන ආයතනවල අපරාධ නඩු ප්‍රමාද වන ආකාරය................. 180

5.3.1 නීතිපති උපදෙස් ප්‍රමාදය........................................ 180-193

5.3.2 රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම........................................ 193-201

5.3.3 පොලිස් විමර්ශනවල දුර්වලතා........................................ 201-208

5.3.4 වෛද්‍ය වාර්තා ප්‍රමාදවීම........................................ 208-215

5.3.5 ඇඟිලි සලකුණු වාර්තා ප්‍රමාදවීම........................................ 215-221

5.3.6 නීතිඥ මහත්ම මහත්මීන්ගේ දුර්වලතා........................................ 221-226

5.3.7 විනිසුරුතුමන්ලා සහ කාර්ය මණ්ඩලයේ ප්‍රමාදය............................. 226-232

## හයවැනි පරිච්ඡේදය - දත්ත විශ්ලේෂණය

6. අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාදයේ ආසන්නතම

සමාජ ප්‍රතිවිපාක (ක්ෂේත්‍ර දත්ත ඇසුරින්) ........................................................ 233-236

6.1 පවුල් සංස්ථාවට සිදුවන බලපෑම........................................................................ 237-239

6.1.1 ආර්ථික වශයෙන් අස්ථාවර වීම...................................................... 239-242

6.1.2 මානසික වශයෙන් අස්ථාවර වීම......................................................... 242

6.1.3 ආරක්ෂාව සම්බන්ධයෙන් අස්ථාවර වීම............................................. 243

6.2 රැකියාව අස්ථාවර වීමේ සමාජ ප්‍රතිවිපාක............................................... 243-246

6.3 කාන්තාවන් විවාහවීම ප්‍රමාදයේ සමාජ ප්‍රතිවිපාක.................................... 246-247

6.4 සැකකරුවන් බන්ධනාගාරගත වීමේ සමාජ ප්‍රතිවිපාක................................ 247-249

6.5 රජයට දැරීමට සිදුවන පිරිවැය........................................................................... 249-250

6.6 රජයේ නිලධාරීන්ගේ කාලය නාස්තිවීමේ සමාජ ප්‍රතිවිපාක................... 250-251

6.7 චූදිතයන් නිදැල්ලේ හැසිරීමෙන් අපරාධ බහුලවීමේ සමාජ ප්‍රතිවිපාක.......... 251-253

6.8 අධිකරණ පද්ධතිය පිළිබඳ ජනතා විශ්වාසය බිඳවැටීම.............................. 253-254

6.9 සාක්ෂිකරුවන්ගේ මතකය අමතකවීමේ සමාජ ප්‍රතිවිපාක.................. 254-255

6.10 පාර්ශ්වයන් අධිකරණයට නොපැමිණීමේ සමාජ ප්‍රතිවිපාක........................ 255-258

## හත්වැනි පරිච්ඡේදය

7.1 සමාලෝචනය ........................................................ 259-266

7.2 නිගමන ............................................... 267-272

7.3 යෝජනා ............................................. 272-278

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලි ..................................................................... 279-287

## වගු සටහන


| වගු අංක | | පිටු අංකය |
|---|---|---|
| 1.1 | නියැදියේ ස්වභාවය. | 7 |
| 5.1 | අවුරුදු 05ට වැඩි විභාගවන නඩු සංඛ්‍යාව. | 175 |
| 5.2 | අවුරුදු 05ට වඩා වැඩි අවසාන නඩු සංඛ්‍යාව | 188 |
| 5.3 | නීතිපති උපදෙස් සඳහා යොමු කළ නඩු සංඛ්‍යාව | 183 |
| 5.4 | දත්තදායකයන්ගේ සේවා පළපුරුද්ද | 187 |
| 5.5 | නීති උපදෙස් ලබාදීමට ඇති බාධක | 189 |
| 5.6 | නිලධාරීන් සාපේක්ෂකව ලැබෙන නඩු සංඛ්‍යාව | 191 |
| 5.7 | රස පරීක්ෂක වාර්තා කැඳවූ නඩු සංඛ්‍යාව | 194 |
| 5.8 | දත්තදායකයන්ගේ සේවා පළපුරුද්ද | 196 |
| 5.9 | රස පරීක්ෂක වාර්තා එවීමට ඇති බාධක | 198 |
| 5.10 | පොලිසියට අපරාධ චෝදනාවක් යොමුකිරීමට ගතවන කාලය | 202 |
| 5.11 | පොලිස් නිලධාරීන්ට පැමිණිල්ල යොමුකිරීමට ඇති බාධක | 204 |
| 5.12 | වෛද්‍ය වාර්තා යැවීමට ඇති බාධක | 211 |
| 5.13 | ඇඟිලි සලකුණු නිලධාරීන්ගේ සේවා කාලය | 216 |
| 5.14 | බාධක වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග | 220 |
| 5.15 | දත්තදායකයන්ගේ සේවා කාලය | 222 |
| 5.16 | අපරාධ නඩු ප්‍රමාදයට හේතු (නීතිඥ ඇසින්) | 223 |
| 6.1 | නඩු ප්‍රමාදයේ සමාජ ප්‍රතිවිපාක | 237 |
| 6.2 | රිමාන්ඩ් ගතවූවන්ගේ සංඛ්‍යාව | 247 |

# ප්‍රස්තාර සටහන


| ප්‍රස්තාර අංක | | පිටු අංකය |
|---|---|---|
| 1.1 | නියැදියේ ස්වභාවය.......................................................................... | 7 |
| 5.1 | අවුරුදු 05ට වැඩි විභාගවන නඩු සංඛ්‍යාව ................................................ | 172 |
| 5.2 | අවුරුදු 05ට වඩා වැඩි අවසාන නඩු සංඛ්‍යාව................................................ | 178 |
| 5.3 | නීතිපති උපදෙස් සඳහා යොමුකළ නඩු සංඛ්‍යාව....................................... | 184 |
| 5.4 | දත්තදායකයන්ගේ සේවා පළපුරුද්ද............................................................. | 188 |
| 5.5 | නීති උපදෙස් ලබාදීමට ඇති බාධක........................................................ | 190 |
| 5.6 | නිලධාරීන් සාපේක්ෂකව ලැබෙන නඩු සංඛ්‍යාව............................................ | 192 |
| 5.7 | රස පරීක්ෂක වාර්තා කැඳවූ නඩු සංඛ්‍යාව......................................................... | 194 |
| 5.8 | දත්තදායකයන්ගේ සේවා පළපුරුද්ද......................................................................... | 196 |
| 5.9 | රස පරීක්ෂක වාර්තා එවීමට ඇති බාධක.......................................................... | 198 |
| 5.10 | පොලිසියට අපරාධ චෝදනාවක් යොමුකිරීමට ගතවන කාලය...................... | 203 |
| 5.11 | පොලිස් නිලධාරීන්ට පැමිණිල්ල ගොනුකිරීමට ඇති බාධක............................ | 205 |
| 5.12 | වෛද්‍ය වාර්තා යැවීමට ඇති බාධක.................................................................... | 210 |
| 5.13 | ඇඟිලි සලකුණු නිලධාරීන්ගේ සේවා කාලය.............................................. | 216 |
| 5.14 | බාධක වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග............................................. | 220 |
| 5.15 | දත්තදායකයන්ගේ සේවා කාලය........................................................... | 222 |
| 5.16 | අපරාධ නඩු ප්‍රමාදයට හේතු (නීතිඥ ඇසින්)............................................ | 224 |
| 6.1 | නඩු ප්‍රමාදයේ සමාජ ප්‍රතිවිපාක................................................................. | 238 |
| 6.2 | රිමාන්ඩ් ගතවූවන්ගේ සංඛ්‍යාව.................................................................... | 248 |

# පළමු පරිච්ඡේදය

## පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම සහ ක්‍රමවිද්‍යාව

### 1.1 හැඳින්වීම.

කාර්මීකරණය, ගෝලීයකරණය, නවීකරණය යන තෙවැදෑරුම් සමාජ වෙනස්වීමේ අතුරු ප්‍රතිඵල ලෙස ජනගහනය වැඩිවීම, තාක්ෂණයේ ප්‍රගතිය, තොරතුරු තාක්ෂණයේ නව්‍යතාවය ඇතිවීමෙන් මිනිසාගේ එදිනෙදා දිවිය වඩාත් සංකීර්ණ බවට පත් වූයේ ය. මෙහි ප්‍රතිඵලයන් ලෙස සමාජ පර්යායේ ධර්මතා, සාරධර්ම, අගනාකම් බිඳ වැටී පුද්ගලයන් තුළ පැවති සාමුහික විඥානය මෙන්ම සමාජ සම්බන්ධතා බිඳ වැටි පුද්ගලයන් අතර විභේදනය වර්ධනය විය. මෙහි ප්‍රතිඵල ලෙස පුද්ගලයාත් සමාජයත් අනෝමීය තත්ත්වයට පත්වූ බව එමිල් දූර්කයිම් ඔහුගේ 'සමාජයේ ශ්‍රම විභජනය' (Devision of Labour in Society)නම් කෘතියෙන් පෙන්වා දුන්නේය.

දූර්කයිම්ගේ එම න්‍යාය අනුව සමාජයේ පැවති සිරිත්, විරිත් හා ධර්මතාවලට සමාජය තවදුරටත් පාලනය කිරීමට නොහැකි වූ අතර සාම්ප්‍රදායික අවිධිමත් පාලන යාන්ත්‍රණයට හිමිවූයේ සීමාසහිත වැදගත්කමක් පමණි. එහි ප්‍රතිඵල ලෙස නූතන සමාජවල අපරාධ සංඛ්‍යාව වැඩි වූ අතර එය සමාජ ප්‍රශ්නයක් දක්වා වර්ධනය වූයේය. සමාජයේ ඇතිවූ වෙනස්වීම්වලට අනුව යුක්තිය පසිඳලීමේ ක්‍රියාපටිපාටිය ද සුවිශේෂී වෙනස්කම් රැසකට ම බඳුන් විය.

යුක්තිය පසිඳලීමේ ආරම්භයට අනාදිමත් ඉතිහාසයක් ඇත. අපගේ ශිෂ්ටාචාරය කොතරම් ඈතට විහිදී ඇත්ද මෙරට නීති ක්‍රමයේ ඉතිහාසය ද ඒ තාක් දුරට විහිදී ඇතැයි කීම සාවද්‍ය නොවේ. ප්‍රග් ඓතිහාසික යුගයේ ද යුක්තිය පසිඳලීමේ ක්‍රම පවතින්නට ඇත. නමුත් ඒවා ලේඛන ගත නොවීම නිසා එහි ස්වභාවය වර්තමාන මිනිසාට දැන ගන්නට හැකියාවක් නැත. නමුත් ක්‍රි.පූ. 6 වන ශත වර්ෂයේ ශ්‍රී ලංකාව විජය රජුගේ ආගමනයත් සමග ජනාවාස වූවා සේ පිළිගැනේ නම් ලංකාවේ නීතිය හා සම්බන්ධ සියලුම දෑ ඒතාක් දුරට විහිදී යාම දැකිය හැකි ය. පුරාතන ලංකාවේ නීතිය සකස්වීම කෙරෙහි විවිධ හේතු බලපෑ බව

පුරාවිද්‍යාඥයින්, ඉතිහාසඥයින්, නීති විශාරදයින් පෙන්වා දෙති. ඒ අතර හින්දු නීති හා චාරිත්‍ර, ආගමික ලේඛන හා බෞද්ධ චාරිත්‍ර ශාඛ්‍ය හා මෞර්ය චාරිත්‍ර, පෙර සිරිත් හා ගැමි සිරිත් වේ.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය දෙස බැලීමේ දී අවබෝධ වන්නේ යුක්තිය පසිඳලීමේ ප්‍රධානියා වූයේ රජතුමාය. මෙරට සිරකරුවෙකු වූ රොබට් නොක්ස් පෙන්වා දී ඇත්තේ " නීති ගැන කතා කරන විට ප්‍රථමයෙන් කිව යුත්තේ නීතිය යනු රජුගේ කැමැත්ත බවය. රජුගේ හිතුමතය හැර වෙන නීතියක් එහි නැත. රජුගේ මුවෙන් නික්මෙන කවර දෙයක් වුව නොවෙනස් කළහැකි නොවැළැක්විය හැකි රාජ නීතිය වන්නාහ" (නොක්ස්, 1981: 181). මෙයින් ගම්‍යමාන වන්නේ නීතියේ උල්පත රජු බවය. උඩරට රාජධානි සමයේ රජු කේන්ද්‍ර කොටගෙන යුක්තිය පසිඳලනු ලැබූ අවස්ථා පිළිබඳ විවිධ ග්‍රන්ථවල සඳහන් වේ. එමෙන්ම ගම් සභාව, රට සභාව, මහ නඩුව වශයෙන් උසාවි 03 ක් ද තිබී ඇත.

නමුත් කාලයත් සමග ශ්‍රී ලංකාව විවිධ ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයට නතුවීමේ හේතුවෙන් අපගේ නීති ක්‍රමය ද වරින් වර වෙනස් වන්නට විය. නමුත් 1505 සිට පෘතුගීසී ජාතිකයන් ලංකාව පාලනය කළ ද නීති ක්‍රමය එතරම් වෙනස් කිරීමට ඔවුන් උත්සාහ නොදැරූහ.එයට හේතුව ඔව්හු නීතියට වඩා පරිපාලන කටයුතු පිළිබඳ මහත් උනන්දුවක් දැක්වූ බැවිනි. වර්ෂ 1656 දී මෙරටට පැමිණි ලන්දේසීන් විසින් ලංකාව මත රෝම ලන්දේසි නීතියේ මුල් බිජුව වැපුරූ අතර එය වර්තමානයේ මහා වෘක්ෂයක් බවට පත්ව අපගේ නීති ක්ෂේත්‍රයේ අඩකටත් වඩා වසා ගෙන ඇත.

නමුත් වර්ෂ 1796 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ගේ ග්‍රහණයට ලක්වූ අතර යටත් විජිත පාලන ක්‍රමවේදයන්ට අනුව රෝම ලන්දේසි නීතිය මෙන්ම දේශීය නීති ක්‍රමය ද යුක්තිය පසිඳලීමේ ක්‍රමවේද සඳහා භාවිතයට ගැණින. මෙම නීති ක්‍රමය බොහෝ දුරට විධිමත් වූයේ 1833 කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ මඟිනි. 1948 වර්ෂයේ ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වය ලැබීමත් සමග අපගේ නීති ක්‍රමය වෙනස් විය. නමුත් ඉංග්‍රීසි නීතිය සම්පූර්ණයෙන් වෙනස් වුයේ නැත.

ඉහත සඳහන් ආකාරයට විකාශනය වූ නීතිය දැඩිව ක්‍රියාත්මක වුව ද වර්තමාන සමාජයේ පෘථුල ලෙස අපරාධ වර්ධනය වී ඇත. මේ පිළිබඳ ව නිරන්තරයෙන් මහජනතාව කතා බහට ලක් කරන අතර ජනතාව ශෝකයට හා ප්‍රබල කම්පනයට ද පත්වේ. නමුත් සමාජයේ යුක්ති ගරුක පැවැත්ම සඳහා අපරාධ පිළිබඳ කතා කිරීම, කම්පාවීම පමණක් ප්‍රමාණවත් නොවේ. එයට නිශ්චිත කාලයක් තුළ දඬුවමක් ලබා දිය යුතුය. එයට හේතුව දඬුවමෙන් වරදකරු ලබන වේදනාවත් අගතියට පත් පාර්ශ්වය මෙන්ම මුළු මහත් සමාජයම ලබන සතුට පදනම් කොට ගෙන සමාජයේ අපරාධ සංඛ්‍යාව මර්දනය වන බව අපරාධ විද්‍යාඥයන්ගේ අදහසයි.

මෙම අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් එම අපරාධ සිදුවීම මහජනතාවගේ සිත්සතන් තුළින් බැහැර වීමට ප්‍රථම දඬුවම ක්‍රියාත්මක කළ යුතුය. නමුත් ශ්‍රී ලංකා සමාජයේ එය විධිමත්ව සිදුනොවේ. මේ සඳහා යුක්තිය පසිඳලන ආයතනවල කාර්යභාරය වේගවත් කළ යුතුය. එසේ නොවන්නේ නම් යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයේ සමාජ ප්‍රතිවිපාක මුළු සමාජ පද්ධතියේ පැවැත්ම කෙරෙහි ම බලපානු ලැබේ. එයට හේතුව හර්බට් ස්පෙන්සර්ගේ ඓන්ද්‍රීය සාදෘෂ්‍ය (Organic Analogy) සංකල්පයට අනුව සමාජයේ සෑම සමාජ සංස්ථාවක්ම එකට බද්ධ ව අන්තර් යැපීම (Inter Dependences) හා අන්තර් සම්බන්ධතාවයෙන් (Inter Relationships) යුතුව පැවතීමයි.

මේ නිසා යුක්තිය පසිඳලීම ඉක්මන් කිරීම මෙරට දැවෙන අවශ්‍යතාවයක් වී ඇත. පොදු ජනතාව මෙයින් අදහස් කරන්නේ නඩු ඇසීම ඉක්මන් කළ යුතුය යන්නයි. නමුත් මෙය එක් පුද්ගලයෙකුට හා එක් ආයතනයකට කළ හැකි කාර්යයක් නොවේ. මේ හා බද්ධව පවතින ආයතන මෙන්ම පුද්ගලයන් ගණනාවක් සිටිති. අධිකරණය, පොලිසිය, නීතිපති හා රස පරීක්ෂක මෙන්ම ඇඟිලි සලකුණු දෙපාර්තමේන්තු හා නීතිඥ ප්‍රජාව, පැමිණිලි පාර්ශ්වය හා විත්ති පාර්ශ්වය ඒ අතර ප්‍රධාන වේ. මෙම සෑම පාර්ශ්වයකම ව්‍යවස්ථාපිත කාර්යභාරය දම්වැලක පුරුක් මෙන් එකට බද්ධ ව පවතී. එක් පාර්ශ්වයකගේ කාර්යභාරය බිඳ වැටුණු විට සමස්ත යුක්ති පද්ධතියේ ම ක්‍රියාකලාපයට එය බලපානු ලැබේ. එය තරගකරුවන් අතර යෂ්ටි